www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මන් සමාජවාදී සමානතා පක්ෂය යුරෝපීය මැතිවරනයන්ට ඉදිරිපත් වේ

## German Socialist Equality Party to stand in European elections

**ජර්මන් සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2004 පෙබරවාරි 7**

ජර්මන් සමාජවාදී සමානතා පක්ෂය (පීඑස්ජී), ජුනි 11-13 දිනයන්හි පැවැත්වෙන යුරෝපීය පාර්ලිමේන්තු මැතිවරන සඳහා සිය අපේක්ෂකයන්ගෙන් සමන්විත ජාතික ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට, පසුගිය මාසයේ පැවැත් වූ රැස්වීමක දී තීරනය කලේ ය. ජර්මනිය තුල මෙම මැතිවරනය පැවැත්වෙන්නේ ජුනි 13 දා ය.

පීඑස්ජීය, පක්ෂයේ නායක අපේක්ෂකයා වසයෙන්, පක්ෂ සභාපති හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* කර්තෘ මන්ඩල සාමාජික, බර්ලින්හි උල්රිච් රිපර්ට්(52) තෝරා ගෙන ඇත. අනෙකුත් අපේක්ෂකයන් වන්නේ ෆ්‍රැන්ක්ෆට් - මේන් හි රසායනික කම්කරුවකු වූ හෙල්මුට් ආර්න්ස් (54), ඩුයිස්බර්ග්හි ගුරුවරයකු වන ඩියට්චාර් ගෙයිසෙන්කර්ස්ට්ින්ග් (37), ඩුයිස්බර්ග්හි කාර්යාල සේවිකාවක වන එලිසබෙත් සිමර්මාන් (47), බිලෙෆෙල්ඩ්හි භාෂා ගුරුවරියක වන සීලියා සොකොලොව්ස්කි (30) සහ බර්ලින්හි මනෝවිද්‍යාව හදාරන ශිෂ්‍යයකු වන ක්‍රිස්ටෝප් වැන්ඩ්‍රියර් (30) යන අය ය.

පීඑස්ජීය, යුරෝපීය මැතිවරනයන් උපයෝගී කර ගන්නේ, මිලියන සංඛ්‍යාත ජනතාවක් මුහුන පා සිටින දැවෙන ප්‍රශ්නවලට - යුද තර්ජනයට, වැඩෙන දරිද්‍රතාවට, විරැකියාවට හා සමාජ අනාරක්ෂකභාවයට මෙන් ම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් විනාශභාග් කිරීමට - විසඳුම් සොයන දේශපාලන ක්‍රියාමාර්ගයක් පිලිබඳ පලල් සාකච්ඡාවක් අවුලුවා ලනු පිනිස ය.

ජර්මනිය තුල සිය අපේක්ෂකයන් ඉදිරිපත් කලේ වුව ද, පීඑස්ජීයේ මැතිවරන උද්ඝෝෂන සමස්ත යුරෝපය ම අලලා ගනු ඇත. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ජර්මන් ශාඛාව වසයෙන්, පීඑස්ජීය සිය සහෝදර සංවිධානයක් වන බ්‍රිතාන්‍යයේ සමාජවාදී සමානතා පක්ෂය සමග සමීප සහයෝගිතාවයෙන් ක්‍රියා කරයි. පීඑස්ජීයේ මැතිවරන උද්ඝෝෂනයේ කේන්ද්‍රීය අංගයක් වනුයේ, මෙම වසරේ ජනාධිපතිවරනය සඳහා සිය අපේක්ෂකයන් ඉදිරිපත් කරන එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය සමග පවත්වාගෙන යන සමීප සහයෝගිතාව යි.

පීඑස්ජීයේ ක්‍රියාමාර්ගයේ හදවතෙහි ම ඇත්තේ, කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව යි. එය යුරෝපීය සංගමය, එහි ආයතන හා සැලසුම්ගත ව්‍යවස්ථාව ද මෙන් ම නැගෙනහිර යුරෝපය දක්වා සිය ක්ෂේත්‍රය පුලුල් කර ගැනීමේ යුරෝපීය සංගමයේ සැලසුම් ද තීරනාත්මක ලෙස ප්‍රතික්ෂේප කරයි. ඒ සමග ම අපි සියලු ආකාරයේ ජාතිකවාදයන් සහ ස්වෝත්තමවාදයන් ප්‍රතික්ෂේප කරන්නෙමු. ජාතික ස්වාධිපත්‍යය ගැන අවධාරනය කරමින්, නැගෙනහිර යුරෝපය හා තුර්කිය සීල් කර තැබීම, යුරෝපා සංගමයේ වැඩපිලිවෙලට විකල්පයක් නො ව හුදෙක් එම වැඩපිලිවෙලට ම රුකුලක් වනු ඇත. එබඳු පිලිවෙත් ජනතාවන් ජාතික, වාර්ගික හා ආගමික රේඛාවන් ඔස්සේ භේද කොට ඔවුන් මර්දනය කරලීමට සහාය වේ. පීඑස්ජී ය, බැංකුවල හා මහා සමාගම්වල යුරෝපයට එරෙහිව, එක්සත් සමාජවාදී යුරෝපයක් යෝජනා කරයි.

සමස්ත ලෝකය ම සිය ආධිපත්‍යයට ප්‍රචන්ඩ ලෙස යටත් කර ගැනීමේ වොෂින්ටනයේ ප්‍රයත්නය තර්ජනය කරනුයේ ඊනියා තුන්වන ලෝකයේ රටවලට පමනක් නො වේ; එය නැවත වරක් මහ බලවතුන් අතර අවි ගැටුමක අන්තරාය මතු කරයි. පසුගිය වසරේ පෙබරවාරි 15 දා, ලොව පුරා මිලියන සංඛ්‍යාත ජනයා, ඉතා නිවැරදි ලෙස, තමන්ට ම එල්ල වූ ඍජු තර්ජනයක් ලෙස සලකා, ඉරාක යුද්ධයට විරෝධය පල කරමින්, ඉතිහාසයේ විශාල ම යුද විරෝධී බලමුලුගැන්වීම්වලට සහභාගි වූහ.

කෙසේ වෙතත්, යුරෝපයේ ආන්ඩු, ඇමරිකානු අධිරාජ්‍යවාදයට මුහුන දීමට අසමත් ය. බ්‍රිතාන්‍යය, ඉතාලිය, ස්පාඤ්ඤය හා පෝලන්තය යන යුරෝපා ආන්ඩු කීපයක්, වොෂින්ටනයට කොන්දේසි විරහිත ව සහයෝගය දුන් අතර, පැරිසිය හා බර්ලිනය යුද්ධයට දැක් වූ ආරම්භක විරුද්ධත්වය, කිසිදු අයුරකින් බැරෑරුම් එකක් නො වී ය. උදාහරනයක් ලෙස, මේ ආන්ඩු දෙකෙන් එකක් වත්, තම භූමියේ ඇති ඇමරිකානු කඳවුරු වසා දැමීමට කල්පනා කලේ නැත. එසේ කලේ නම්, එම පියවර යුද සූදානමට දැවැන්ත බාධාවක් මතුකරලීමට ඉඩ තිබුනි. එතැන් පටන්, ඒ දෙරටම, මේ පීඩිත රට අත්පත් කර ගැනීමේ ලා සිය පූර්න සහයෝගය ප්‍රකාශ කොට තිබේ. මෙය, ප්‍රන්ස ආරක්ෂක ඇමති මිචෙල් ඇලියොට් - මේරි විසින්, මෑතක දී මෙසේ සූත්‍රගත කරමින්, පැහැදිලිව ප්‍රකාශ කෙරිනි: "ඉරාකය තුල එක්සත් ජනපද අසාර්ථකත්වයක් පිලිබඳ

අවශ්‍යතාවක් කිසිවෙකුට වත් තිබිය නො හැකි ය. එබඳු අසාර්ථකත්වයක් අප සියල්ලන්ගේ ම, සමස්ත ලෝකයේ ම, පරාජයක් වනු ඇත."

ජර්මන් හා ප්‍රන්ස ආන්ඩු ඉරාක යුද්ධය සම්බන්ධයෙන් ආරම්භයේ දැක් වූ විරුද්ධත්වයන්, නිරවශේෂයෙන් බැඳී තිබුනේ ඔවුන්ගේ ම අධිරාජ්‍යවාදී උවමනාවන් සමග ය. තමන්ට ද සැලකිය යුතු තරම් ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන් ඇති කලාපයක් පාලනය කිරීමට එක්සත් ජනපදය තනි අතින් දරන වෑයම දෙස මෙම ආන්ඩු දෙක ම බැලුවේ බියෙන් හා සැකයෙනි. යුද්ධය නතර කිරීමට අසමත් වීමෙන් දැන් ඔවුහු යුරෝපය මිලිටරීකරනය කිරීමේ පිලිවෙත ඉදිරියට ගෙනයමින් අප්‍රිකාවේ, ආසියාවේ සහ ලෝකයේ අන් ප්‍රදේශවල තමන්ගේ ම මැදිහත්වීම් සඳහා සූදානම් වෙති. ඔවුහු ඉරාකයේ ම පවා හමුදා රැඳවීමට සිතා බලති.

යුද්ධයට එරෙහිව සටන් වැදීමට නම් එහි මූලයන් තේරුම් ගැනීම අවශ්‍ය ය. අවසාන විග්‍රහයේ දී, යුද තර්ජනය ධනවාදයේ ලෝක පරිමාන ප්‍රගාඪ අර්බුදයෙන් පැන නැගුනකි. එක්සත් ජනපද ආන්ඩුව ක්‍රියාත්මක වන්නේ එහි ශක්තිමත් භාවය නො ව, එහි දුර්වලභාවය පදනම් කොට ගෙන ය. ඇමරිකානු ධනවාදය මුහුන දී සිටින අභ්‍යන්තර පරස්පරවිරෝධයන් ජය ගනු වස්, වෙලඳ පොලවල්, ලාභ හා ලාභ ශ්‍රමය උදෙදසා ලොව පුරා කටුක අරගලයක් ගෙනයාමට තමන්ට බල කෙරී ඇතැයි එක්සත් ජනපද ආන්ඩුව දකී. එක්සත් ජනපද සසපයේ ජනාධිපති මැතිවරන ප්‍රකාශයට අනුව, ඉරාකය දිග්විජය කිරීමත් සමග එක්සත් ජනපද ආන්ඩුවේ අරමුනු වන්නේ, "ලෝකයේ දෙවන විශාලතම තෙල් නිධිවලට ප්‍රවේශ වීම ය; මැදපෙරදිග මධ්‍යයේ ඇමරිකානු මිලිටරි හමුදා රැඳවීම හා එමගින් තමන්ගේ සියලු විභව ප්‍රතිවාදීන් පරයා, පෙර නො වූ විරූ භූ - මූලෝපායික වාසියක් අත් කර ගැනීමත් සහ තම රට තුල වැඩෙන සමාජ අතෘප්තිය එතෙරට අපසරනය කිරීම ය."

පීඑස්ජී ය අධිරාජ්‍යවාදයට හා යුද්ධයට එරෙහි සිය අරගලය සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම් කරයි. එය ඇමරිකානු කම්කරුවන් ද අන්තර්ගත කර ගැනුනු ජාත්‍යන්තර කම්කරු පන්තිය, එනම් සිය ජීවිත, තම ශ්‍රම ශක්තිය විකිනීම මත රඳා පවතින්නා වූ ද සිය ජීවන කොන්දේසි, ලාභය සාක්ෂාත් කර ගැනුමට මුල් තැන දෙන ක්‍රමයක් හා නො ගැලපෙන්නා වූ ද, සියලු වැටුප් උපයන්නන් - කායික කම්කරුවන් ද ලිපි කටයුතුවල යෙදෙන කම්කරුවන් ද බුද්ධිමතුන් ද - බලමුලු ගැන්වීමට සටන් වදී.

රාජ්‍යය ප්‍රතිසන්නද්ධ කිරීමේ වැඩ සටහන් හා සමාජ ජයග්‍රහන විනාශභාග් කිරීම මගින් තර්ජනයට ලක්ව ඇති ප්‍රජාතන්ත්‍රීය හා සමාජ අයිතීන් දෘඪතරව ආරක්ෂා කිරීම වෙනුවෙන්  පීඑස්ජී ය පෙනී සිටී. සමාජවාදී මූලධර්මවල පදනම මත ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම - එනම්, බැංකු සහ ප්‍රධාන සමාගම් සමාජ පාලනයකට නතු කිරීම සහ ධනවත් අල්පතරයකගේ ලාභ හඹායාම උදෙසා නො ව සමාජ අවශ්‍යතාවන් උදෙසා නිෂ්පාදනය සංවිධානය කිරීම සඳහා එය සටන් වදී.

ධනේශ්වර ක්‍රමය, සමාජමය වගකීමක් ඇති ආකාරයකට සංවිධානය කල හැකි බවත් කම්කවරුන්ගේ අවශ්‍යතාවන්ට යෝග්‍ය වන සේ ප්‍රතිසංස්කරනය කල හැකි බවත් සිය තර්කය ලෙස යොදා ගනිමින්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, ධනවාදය ආරක්ෂා කිරීමේ සිය පිලිවෙත, නිරතුරුව ම යුක්ති යුක්ත කර ඇත. අද දින එවැනි සංකල්පයන්ගෙන් කිසිවක් ඉතිරිව නැත. ජර්මන් එස්පීඩීය හා යුරෝපය පුරා අනෙකුත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ මුලුමනින් අවමානයට පාත්‍රව ඇත. ඔවුහු සමාජ ජයග්‍රහනයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි ප්‍රහාර මෙහෙයවමින් සිටිති. ඔවුන්ගේ කොන්සර්වටිව් විරුද්ධවාදීන්ගෙන් ඔවුන් කිසිසේත් වෙන් කොට හඳුනා ගත නො හැක. ටෝනි බ්ලෙයාර්ගේ ලේබර් පක්ෂය පරම-කොන්සර්වටිව් මාග්‍රට් තැචර්ගේ වැඩපිලිවෙල බාරගෙන තිබේ. ගෙහාර්ඩ් ෂ්‍රෝඩර්ගේ "2010 න්‍යාය පත්‍රය" ඉදිරියේ, ඔහුගේ කොන්සර්වටිව් පූර්වප්‍රාප්තික හෙල්මුට් කෝල් විසින් සුබ සාධන රාජ්‍යයට එරෙහිව ගෙන ගිය ප්‍රහාරයන් අඟුටුමිටි තත්වයට පත්ව ඇත.

ඉතාලියේ හා ප්‍රන්සයේ ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂවලට ද මෙය ම අදාල ය. ජර්මනියේ "ප්‍රජාතාන්ත්‍රික සමාජවාදය සඳහා වූ පක්ෂයේ (පීඩීඑස්) සමාජවාදය පිලිබඳ සියලු කතා එය දේශපාලන වගකීම බාර ගත් සැනින් සුලඟේ පා කර හැරින. බර්ලිනයේ එස්පීඩී-පීඩීඑස් සභාගය ජර්මනිය තුල සමාජ අයිතීන්ට සහ රාජ්‍ය සේවයේ කම්කරුවන්ගේ රැකියා හා වැටුප්වලට එරෙහිව ප්‍රහාර එල්ල කිරීමෙහි ලා නායක කාර්යභාරයක් අත්පත් කර ගෙන තිබේ.

පීඑස්ජීයේ අරමුන, ඔවුන් "ප්‍රතිසංස්කරනය කිරීම" හෝ "ප්‍රගතිශීලි" ස්තරයන් දිනා ගැනීම හෝ පිනිස මෙම පක්ෂවලට පීඩනය දැමීම නො වේ. එබඳු ඉදිරිදර්ශනයක් ක්‍රියාවට දැමිය නො හැක්කා වූත් ප්‍රතිගාමී වූත් එකකි. එය එවන් සංවිධානවලට හුදෙක් වාම කවරයක් සම්පාදනය කිරීමට සේවය කරන්නක් වනු ඇත. පීඑස්ජී යේ අරමුන වන්නේ, මෙම පක්ෂවල බලපෑමෙන් කම්කරුවන් නිදහස් කරගෙන ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කිරීම ය.

අපි විසිවන සියවසේ පාඩම් මත පදනම් වෙමු. අපි, හතර වන ජාත්‍යන්තරයේ ජර්මන් ශාඛාව ලෙස, ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රයට එරෙහිව සෝවියට් සංගමයේ සමාජවාදී පදනම් ආරක්ෂා කල, ලියොන් ට්‍රොට්ස්කි විසින් පිහිටුවන ලද, වාම විපාර්ශ්වයේ සම්ප්‍රදායන් වෙනුවෙන් පෙනී සිටිමු. සමාජවාදය සමග නිලධාරිමය කුලයක අත්තනෝමතික ඒකාධිපතිත්වය සමාන කල හැකි ය යන ස්ථාවරයට හතර වන ජාත්‍යන්තරය නිරන්තරයෙන් ම විරුද්ධව ඇත.

සමාජවාදය ගොඩ නැගිය හැක්කේ කම්කරු ජනතාවගේ පුලුල් ම ප්‍රජාතන්ත්‍රීය සහභාගිත්වයක පදනම මත පමනකි.

එලඹෙන සතිවල දී පීඑස්ජී ය, ඉහත සාරාංශ ගත කෙරුනු ඉදිරිදර්ශනය සවිස්තරාත්මකව පැහැදිලි කෙරෙන, එහි මැතිවරන ප්‍රකාශනය එලිදක්වනු ඇත.

පීඑස්ජීයේ මැතිවරන උද්ඝෝෂනයට ක්‍රියාකාරීව සහයෝගය දෙන ලෙස අපි *ලෝසවෙඅ* සියලු පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු. උද්ඝෝෂනයේ ප්‍රථම අදියර සමන්විත වන්නේ, මැතිවරනයට ඉදිරිපත්වීමට සුදුසුකම් ලබනු වස් සහයෝගය දක්වන්නන්ගේ වලංගු අත්සන් 4000ක ප්‍රමානය එක්රැස් කර ගැනීමේ ප්‍රයත්නයෙනි. දෙවන අදියර, භාෂා කීපයකින් ප්‍රකාශයට පත් කෙරෙන අපේ මැතිවරන ප්‍රකාශනය පුලුල් ලෙස බෙදා හැරීමෙනුත් එමෙන් ම අපේ ක්‍රියාමාර්ගය සාකච්ඡා කෙරෙන රැස්වීම් සංවිධානය කිරීමෙනුත් සමන්විත වෙයි. අපගේ උද්ඝෝෂනයේ අමතර විස්තර, මැතිවරනයට ඉදිරිපත්වීමට සහයෝගය දැක්වීමේ ආකෘති පත්‍ර හා අනෙකුත් මැතිවරන ලේඛනාදිය අපගේ මැතිවරන උද්ඝෝෂනයට කැපවුනු විශේෂ වෙබ් අඩවියක පල කෙරෙනු ඇත.

© www.wsws.org